රංගන ශිල්පීන් දෙදෙනෙකු සමග කල පිළිසඳර ලිපි දෙකක්, ඔක්තෝබර් 17 සහ 24 දිනවල ලංකාදීප සඳැල්ල අතිරේකයන් තුළ පළ වී තිබිණි. මෙම සාකච්ඡා ලිපි වල සිරස්තල වූයේ "තරබාරුව මට ආශිර්වාදයක්" යන්න සහ"ඇඟ මහත්වෙන්නෙ පවුලෙ ආරෙට" යන්නයි. මෙම සිරස්තල දෙකම මගින් ඔවුන්ගේ ශරීර ප්‍රමාණයට මුල් තැනක් දී තිබුනි.

මෙම පිළිසඳර ලිපි තුළ අදාළ රංගන ශිල්පීන්ගෙන් අසා තිබූ විවිධ ප්‍රශ්න අතර, "නලුවෙක් නිසාවත් ඇඟ කෙට්ටුවට තියාගන්න හිතෙන්නේ නැද්ද?", "ඇඟ එහෙම අඩු කරගන්න අදහසක් නැද්ද?" සහ " 'නානා' පාසල් සමයේදී මෙච්චර තරබාරු නැතුව ඉන්න ඇති නේද?" වැනි ප්‍රශ්න ඇසී තිබිණි. ශ්‍රී ලංකාවේ පුවත්පත් වල ටැබ්ලොයිඩ් අතිරේකයන් හි පළ වන මෙවැනි පිළිසඳර ලිපි තුළ, බොහෝ විට රංගන ශිල්පීන්ගෙන්, ඔවුන්ගේ බාහිර පෙනුම සම්බන්ධ ප්‍රශ්න ඇසීම සුලබව දක්නට ලැබේ. එවැනි ප්‍රශ්න ඇසීම අප රටේ සාමාන්‍යකරණය වී තිබේ. නමුත් වෙනත් බොහෝ රටවල එසේ ශරීරයේ බාහිර පෙනුම පිළිබඳ ප්‍රශ්න නැගීම ශිෂ්ට සම්පන්න නොවේ යැයි සැලකේ. සුපවේදිනියක් වන ටිලී රම්සිගේ ශරීරය තරමක් තරබාරු (chubby) යැයි පැවසූ නිවේදකයකු ජනතා අප්‍රසාදයට ලක් වූ සිදුවීම ඊට උදාහරණ ලෙසින් දැක්විය හැක.

1) මෙම පිළිසඳරට වැදගත් වන්නේ මෙම රංගන ශිල්පීන්ගේ ශරීර ප්‍රමාණය හෝ බාහිර පෙනුමද? එසේත් නැතිනම් ඔවුන්ගේ රංගන කුසලතාවය ද?

2) එසේනම් එය සිරුරේ බාහිර පෙනුම පාදක කරගනිමින් සිදුකෙරෙනා කොන් කිරීමක් නොවන්නේද?

3) මෙසේ පිළිසඳර ලිපියක් සඳහා වන සාකච්ඡාවන් හිදී, ශරීරයේ බාහිර පෙනුම සම්බන්ධයෙන් මෙලෙස ප්‍රශ්න ඇසීම කෙතරම් යෝග්‍ය වන්නේද?

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa #Sadella**